www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පැරා-මිලිටරි නායකයා බ්‍රිතාන්‍යයේ දී නඩුවක වරදකරුවකු කෙරෙයි

## Sri Lankan paramilitary leader convicted in Britain

**අද්‍රියන් සිල්වා විසිනි**
**2008 මාර්තු 13**

තමිලීල මක්කල් විඩුතලෙයි පුලිකල් (ටීඑම්වීපී) සංවිධානයේ හිටපු නායකයා වන විනයාගමූර්ති මුරලිදරන් නොහොත් කරුනාට එරෙහි බ්‍රිතාන්‍ය අධිකරනයේ විභාග වූ නඩුවක් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යලි ඇරඹීමෙහි ලා ශ්‍රී ලංකාවේ ආන්ඩුව හා විවිධ පැරා-මිලිටරි කන්ඩායම් අතර පැවති සහ-ක්‍රියාකාරිත්වය වෙත තවත් ආලෝක ධාරාවක් එල්ල කර ඇත. පෙර දී කරුනා කන්ඩායම ලෙස ප්‍රසිද්ධ ටීඑම්වීපී එල්ටීටීඊයෙන් භේද වූ කන්ඩාමක් වූ අතර එය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පලාත තුල පදනම් වේ.

ජනවාරි 25 දා බ්‍රිතාන්‍යයේ අයිල්වර්ත් ක්‍රව්න් අධිකරනය හැඳුනුම්පත් වංචාවක් හා එක්සත් රාජධානියේ 2006 හැඳුනුම්පත් පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කරුනාට මාස නවයක සිර දඬුවමක් නියම කලේ ය. මෙම ප්‍රතිගාමී නීතිය පුද්ගලයන්ගේ පෞද්ගලික තොරතුරු වඩ වඩා වැඩි ප්‍රමානයක් රැස් කර තබා ගැනීමේ අවසරය රාජ්‍යයට ලබා දෙන අතර විශේෂයෙන් ම ආගමනිකයන් ඉලක්ක කර ගනු පිනිස බ්‍රිතාන්‍ය ආන්ඩුව විසින් එය යොදා ගනු ලැබ ඇත.

කෙසේ වෙතත්, කරුනාගේ නඩුවේ දී, තමන්ට සාවද්‍ය අනන්‍යතාවක් ලබා දෙන ගමන් බලපත්‍රයක් තමන් සතුව තිබූ බව ද ඒ සම්බන්ධයෙන් වරදකරු බව ද ඔහු පිලිගත්තේ ය. කරුනාට එරෙහි ප්‍රධාන චෝදනාව වූයේ සිය ඡායාරූපය සහිත එහෙත් වෙනත් අයකුගේ නමක් දරන රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රයකින් එක්සත් රාජධානියට පැමිනීම යි. ඔහුට රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රයක් හා බ්‍රිතාන්‍ය වීසා බලපත්‍රයක් ලැබුනේ කෙසේ ද යන්න ශ්‍රී ලංකාවේ ආන්ඩුවේ ජ්‍යෙෂ්ඨයන් සමග ඔහුගේ සබඳතා පිලිබඳ ප්‍රශ්න මතු කරයි.

අධිකරන වාර්තාවන්ට අනුව, කරුනා බ්‍රිතාන්‍යයට ඇතුලු වූයේ පසුගිය වසරේ සැප්තැම්බර් 18 දා ය. ලන්ඩනයේ දකුනු කෙන්සිංටන්හි මහල් නිවාසයක දී නොවැම්බර් 2 දා බ්‍රිතාන්‍ය නිලධාරින් විසින් ඔහු අත් අඩංගුවට ගන්නා ලදි. සිංහල නමක් වන කෝකිල දුෂ්මන්ත ගුනවර්ධන යන නමින් ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රයක් ඔහු සතුව තිබුනි.

ගමන් බලපත්‍රය සාවද්‍ය නමක් දැරුවා වුවත් එය අව්‍යාජ එකක් බවත් කොලඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් ඔහුට වලංගු වීසා බලපත්‍රයක් නිකුත් කොට තිබූ බවත් බ්‍රිතාන්‍ය පොලීසිය තහවුරු කලේය. මහ කොමසාරිස් කාර්යාලය පෙරලා කියා සිටියේ කරුනා භාවිතා කල ගමන් බලපත්‍රය අනුග්‍රාහක වීසා ඉල්ලුම් පත්‍රයක් සහිතව ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යංශය වෙතින් තමන්ට ලැබුන බව යි.

දේශීය මූලාශ්‍රයන් මත පදනම්ව ශ්‍රී ලංකාවේ සතිපතා පුවත්පතක් වන සන්ඩේ ලීඩර් කියා පෑවේ, ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ආන්ඩුවේ ඉහල බලධාරින්ගේ අනකට අනුව අගෝස්තු 18 දා එම ගමන් බලපත්‍රය නිකුත් කර ඇති බව යි. ඔහු වන ජීවී සංරක්ෂන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් බවට ඔහුගේ වීසා ඉල්ලුම් පත්‍රය සාවද්‍ය ලෙස ප්‍රකාශ කල බව ද වාර්තාව සඳහන් කලේ ය. සන්ඩේ ටයිම්ස් ඇතුලු සෙසු පුවත්පත් වාර්තා කලේ කරුනාට සිය සංචාරය තුල දී එක්සත් රාජධානියේ දී ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සහයෝගය ලැබුනු බව යි.

ශ්‍රී ලංකාවේ ආන්ඩුව නිකම්ම ප්‍රශ්නය මග හැරියේ ය. කරුනාට රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රයක් ලබා දීමට ආන්ඩුව කිසිදු අයුරකින් සම්බන්ධ නැති බව විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම ප්‍රකාශ කලේ ය. එහෙත් ඔහු අදාල මාධ්‍ය වාර්තා ප්‍රතික්ෂේප කලේ නැත.

ජනවාරි 25 දා විවෘත අධිකරනයේ දී කියවන ලද කරුනාගේ නිල ප්‍රකාශය ශ්‍රී ලංකාවේ ආන්ඩුව බරපතල අපහසුතාවකට පත් කලේ ය. වරද පිලිගනිමින් කරුනා කියා සිටියේ, තමාගේ එක්සත් රාජධානි සංචාරය සම්බන්ධ "සෑම දෙයක් ම පිලියෙල කලේ" ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ බව යි. තමන් එල්ටීටීඊයෙන් බිඳුනු කාලයේ පටන් ම තමා ගෝඨාභය රාජපක්ෂ හඳුනා ගෙන සිටි බව ද කරුනා සඳහන් කලේ ය.

එම ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් ගෝඨාභය රාජපක්ෂ ජනවාරි 27 දා ලක්බිම නිව්ස් පත්‍රයට මෙසේ පැවසී ය: "මම ඔහුට (කරුනාට) උදව් කරලා නැහැ." ආරක්ෂක

ලේකම් මෙසේ පැවසූ බව *අයිඒඑන්එස් නිව්ස්* උපුටා දැක්වී යඃ "මම දන්නෙ නැහැ කරුනා කොහොමද ගමන් බලපත්‍රය ලබා ගත්තෙ කියලා." මහ කොමසාරිස් කාර්යාලයේ හෝ ලන්ඩනයේ නිලධාරින්ගේ සම්බන්ධයක් ඇගවුම් කරමින්, කරුනා බ්‍රිතාන්‍ය වීසා බලපත්‍රයක් ලබා ගත්තේ කෙසේ ද යන වග ද ඔහු ප්‍රශ්න කලේ ය.

කෙසේ වෙතත්, *අයිඒඑන්එස් නිව්ස්* පුවත් සේවයට දුන් සම්මුඛ සාකච්ඡාව තුල දී තමන් කරුනා දැන සිටි බව රාජපක්ෂ පිලිගත්තේ ය. "බොහෝ කලකට ඉහත දී එක්සත් රාජධානියට යාම සඳහා කරුනා ඔහුගෙන් උදව් ඉල්ලා තිබුනි. ඒ වන විට එහි ගොස් සිටි සිය දරුවන් බැලීමට කරුනාට අවශ්‍යව තිබූ බව ඔහු පැවසී ය. මිතුරු තෙවන රටක් හරහා සංචාරයක් සංවිධානය කිරීමට තමන් උත්සාහ කල නමුත් එම ප්‍රයත්නය අසාර්ථක වූ බව රාජපක්ෂ කියා පෑවේ ය.

විශේෂයෙන් ම එලිදරව්කාරී ප්‍රකාශයක් කරමින් රාජපක්ෂ මෙසේ පැවසී යඃ "ඔහු ශ්‍රී ලංකාව තුල ප්‍රයෝජනවත් වන තතු තුල ඔහුව පිටරට යවන්න මට අවශ්‍ය ඇයි?" රාජපක්ෂ එය විස්තාරනය නොකල මුත් පසුගිය වසර දෙක මුලුල්ලේ නැගෙනහිර දෙමල ජනතාව ත්‍රස්ත කිරීමෙහි ලා සහ එල්ටීටීඊයට ප්‍රහාර එල්ල කිරීමෙහි ලා කරුනා කන්ඩායම මිලිටරිය සමග සහයෝගීව ක්‍රියා කර තිබේ. එවන් සහයෝගයක් පවත්නා බව ආන්ඩුව නැවත නැවතත් ප්‍රතික්ෂේප කර ඇති නමුදු ආරක්ෂක ලේකම්ගේ පිලිගැනීම කරුනා සමග සමීප සබඳතාවක් පැවති බවට සාක්ෂ්‍ය දරයි.

එල්ටීටීඊයෙන් බිඳීමට පෙරාතුව කරුනා එහි ජ්‍යෙෂ්ඨ නායකයෙක් විය. මහ බලවතුන්ගේ පිටුබලය සහිතව 2002 දී කොලඹ ආන්ඩුව විසින් ආරම්භ කරන ලද සාම සාකච්ඡාවල දී ඔහු එල්ටීටීඊයේ නියෝජිතයකු ලෙස සහභාගි විය. සාම ක්‍රියාදාමය පදනම් වූයේ දෙමල ජනතාවට ප්‍රජාතන්ත්‍ර අයිතීන් ප්‍රදානය කිරීම මත නොව දෙමල හා සිංහල යන දෙවර්ගයේ ම කම්කරු පන්තිය අන්‍යොන්‍ය වසයෙන් සූරාකෑම පහසු කරන බලය බෙදා ගැනීමේ සැකැස්මක් තහවුරු කර ගැනීම මත ය.

හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග පිටුපසින් රැලි වූ පාලක ප්‍රභූවේ කොටස්, මිලිටරියේ ඉහල නිලධරය සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි ස්වෝත්තමවාදී කන්ඩායම් සමග එක්ව, "සාම ක්‍රියාදාමයට" විරුද්ධ වූයේ එය පාවාදීමක් බව කියාපාමිනි. 2003 නොවැම්බරයේ දී එක්සත් ජාතික පක්ෂයේ (එජාප) නායකත්වයෙන් යුත් ආන්ඩුවේ මූලික අමාත්‍යංශ තුනක් පවරා ගත් කුමාරතුංග 2004 පෙබරවාරියේ දී සමස්ත කැබිනට් මන්ඩලය ම බලයෙන් පහ කලා ය.

2004 මාර්තුවේ දී කරුනා එල්ටීටීඊයෙන් භේද විය. නැගෙනහිරට වඩා උතුරට සලකන බවට එල්ටීටීඊ නායකත්වයට චෝදනා කල ඔහු හා ඔහුගේ සගයෝ එම පිලිවෙත තියුනු ලෙස විවේචනය කලහ. එල්ටීටීඊයේ නැගෙනහිර අංශයට "ස්වාධීනව ක්‍රියාත්මක වීමට" ඉඩ දෙන ලෙස ඉල්ලූ ඔහු නැගෙනහිර පලාතේ මඩකලපු-අම්පාර ප්‍රදේශවලට වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් ද ඉල්ලා සිටියේ ය. නැගෙනහිර දෙමල ප්‍රභූවට වාසි ලැබෙන පරිදි කොලඹ ආන්ඩුව සමග ගිවිසුමක් ගසා ගැනීමට උත්සාහ කල කරුනාගේ දෘෂ්ටිය හුදෙක් එල්ටීටීඊයේ ම දේශපාලනයේ තාර්කික දිගුවක් විය.

එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ කාන්තා අන දෙන නිලධාරිනියක වූ නිලාවනි කරුනා සමග පෙල ගැසී 2004 මැද දී ඔහු කැටුව කොලඹට ද පැමිනියා ය. කෙටි කලකට පසුව, කරුනාගෙන් භේද වූ ඇය එල්ටීටීඊ නායකත්වය සමග සංහිඳියාවකට පැමින කිලිනොච්චියේ පිහිටි එහි උතුරු මූලස්ථානය වෙත ගියා ය. කොලඹ දී ශ්‍රී ලංකා මිලිටරි ඔත්තු අංශය කරුනාට ආරක්ෂාව සපයමින් ඔහු සමග දීර්ඝ සාකච්ඡා පැවැත්වූ ආකාරය 2004 ජූනියේ දී බීබීසී පුවත් සේවයට ඇය පැහැදිලි කලා ය.

"මුල දී කොලඹ දී ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවේ රැකවරනය යටතේ අපි ඔක්කොම සිටියේ එකට. පසුව කරුනා වෙනම ස්ථානයකට ගෙන ගියා." යැයි නිලාවනි ප්‍රවෘත්ති සාකච්ඡාවක දී පැවසුවා ය. කොලඹ දී දින තුනක් තිස්සේ ඔවුහු තරු පහේ හිල්ටන් හෝටලයේ රඳවා ගෙන සිට පසුව මිලිටරි ආරක්ෂක නිවාසයකට ගෙන යන ලදි. එල්ටීටීඊයේ භේදය සැලසුම් කිරීමට ශ්‍රී ලංකාවේ හා සමහර විට ඉන්දියාවේ ඔත්තු සේවා සම්බන්ධිත බවට ඇයගේ ප්‍රකාශය තව දුර සාක්ෂ්‍යයකි.

මාස කිහිපයකට පසුව, ආරක්ෂක හමුදාවල වක්‍ර ආරක්ෂාව යටතේ කොලඹ සහ නැගෙනහිර සිය දේශපාලන පක්ෂය වන ටීඑම්වීපී සංවිධානයේ මහජන කාර්යාල විවෘත කිරීමට කරුනාට හැකි විය. නැගෙනහිර එල්ටීටීඊයේ බලය දුර්වල වීමේ වාසිය ඩැහැ ගනු වස් යුද්ධය යලි අරඹනු පිනිස මිලිටරියේ කොටස් කල බල කිරීමෙහි ලා කරුනාගේ මෙම භේදය එක සාධකයක් විය. සටන් විරාම ගිවිසුම සමාලෝචනය කිරීමක් ඉල්ලා සිටීම මගින් යුද්ධයක් අවුලුවා ගැනීමට සැලසුම් කෙරුනු වැඩපිලිවෙලක් මත රාජපක්ෂ 2005 නොවැම්බරයේ දී ජනාධිපතිවරනය යන්තමින් ජය ගත්තේ ය.

මැතිවරනයෙන් මද කලකට පසුව ආරම්භ වූ ප්‍රචන්ඩ ප්‍රකෝපකරනවලට කරුනා කන්ඩායම සම්බන්ධිත බවට පුලුල්ව විශ්වාස කෙරේ. 2005 නත්තල් උදාව ඉස්මත්තේ දී ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා මඩකලපුව නගරයේ ශාන්ත මරියා දේවස්ථානයේ දී, ප්‍රමුඛ

එල්ටීටීඊ-හිතැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ ජෝශප් පරරාජසිංහම් ඝාතනය කිරීමට මෙම කන්ඩායම සම්බන්ධිත බවට චෝදනා එල්ල විය.

2006 අප්‍රේල් 7 දා, තවත් ප්‍රමුඛ එල්ටීටීඊ-හිතැති දේශපාලනඥයකු වූ වී. විග්නේස්වරන් ත්‍රිකුනාමලයේ අධි ආරක්ෂක කලාපයක් තුල දී ඝාතනය කෙරුනි. එල්ටීටීඊයට විරුද්ධ සංවිධානයක් ලෙස ප්‍රකට "මානව හිමිකම් උදෙසා විශ්වවිද්‍යාල ආචාර්යවරු" (යූටීඑච්ආර්, යාපනය) නිකුත් කල වාර්තාවක් 2006 ඔක්තෝබරයේ දී ප්‍රකාශ කලේ "රියසීලන් (සීලන්) නම් කරුනා කන්ඩායමේ සාමාජිකයකු විසින් විග්නේස්වරන් ඝාතනය කරන ලදී" බව යි.

2006 නොවැම්බරයේ දී, ළමුන් හා අවි ගැටුම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ නියෝජිතයාගේ විශේෂ උපදේශක ඇලන් රොක්, ශ්‍රී ලංකාවේ සිදු කල දින 10ක තොරතුරු ගවේෂන මෙහෙයුමකට පසුව මාධ්‍යවලට පැවසුවේ, ළමුන් පැහැර ගැනීමේ කරුනා කන්ඩායමේ ක්‍රියාවන්ට මිලිටරියේ කොටස්වල සහයෝගය හා සහභාගිත්වය ලැබී ඇති බවට "බලගතු හා විශ්වාසනීය" සාක්ෂ්‍ය පවතින බව යි. කරුනා කන්ඩායමේ සාමාජිකයන් මිලිටරි මාර්ග බාධක හරහා විවෘතව අවි රැගෙන යමින් සහ ප්‍රචන්ඩ ක්‍රියාවල හා බියගැන්වීම්වල නිරත වෙමින් නැගෙනහිර පලාත තුල නිදහසේ සැරිසරන බවට ඔහු පැමිනිලි කලේ ය.

යුනිසෙෆ් සංවිධානයට අනුව, අම්පාර, මඩකලපුව හා ත්‍රිකුනාමල දිස්ත්‍රික්කවල පවුල් 2006 දෙසැම්බර් 31 වන විට කරුනා කන්ඩායම සිදු කල ළමුන් පැහැර ගැනීම් 208ක් වාර්තා කර තිබුනි. මානව හිමිකම් කන්ඩායම් මෙන් ම සටන් විරාමය අධීක්ෂනය කල ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ (එස්එල්එම්එම්) නිලධාරීන් ද මිලිටරිය හා පොලීසිය සමග කරුනා කන්ඩායමේ සහයෝගිතාවක් පවතින බවට වාර්තා කලේ ය. රාජපක්ෂ ආන්ඩුව 2006 දී යුද්ධය යලි දියත් කිරීමෙන් පසුව, කරුනා කන්ඩායමේ කොටස් මිලිටරි මෙහෙයුම්වල දී සහයෝගීව ක්‍රියා කල බවට එම වාර්තා මගින් පෙන්නුම් කෙරුනි.

2007 මැද දී, ටීඑම්වීපී සංවිධානය තුල, කරුනා ද පිල්ලෙයාන් නමින් ප්‍රසිද්ධ ඔහුගේ දෙවැනියා වූ එස්. චන්ද්‍රකාන්තන් ද අතර අභ්‍යන්තර ගැටුමක් හට ගත්තේ ය. ඔහුගේ කන්ඩායම සිදු කල ළමුන් පැහැර ගැනීම් හා ඝාතන හේතු කොට ගෙන නැගෙනහිර දෙමල ජනයා අතර වඩ වඩා අපකීර්තියට පත්ව, ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවල විවේචනයට ද ලක්ව සිටි කරුනා සිය රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රය යොදා ගෙන බ්‍රිතාන්‍යය බලා ගියේ ය. ඔහු අත් අඩංගුවට ගැනීමෙන් දින තුනකට පසුව, පිල්ලෙයාන්ට පක්ෂපාතී කොටස් නොවැම්බර් 5 දා සිදු කල හදිසි හා තීරනාත්මක බල කොල්ලයකින් මඩකලපුවේ ටීඑම්වීපී කාර්යාල අල්ලා ගෙන ඉතිරිව සිටි කරුනාට පක්ෂපාතී කොටස් අත් අඩංගුවට ගත්හ.

දැන් කරුනා කන්ඩායම හැඳින්වෙන්නේ පිල්ලෙයාන් කන්ඩායම ලෙස ය. ආන්ඩුව හා මිලිටරිය නව නායකත්වය සමග ඉක්මනින් ම ක්‍රියාකාරී සබඳතාවක් ගොඩනගා ගත්තේ ය. රාජපක්ෂගේ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) මාර්තු 10 දා පැවති මඩකලපුව දිස්ත්‍රික්කයේ පලාත් පාලන මැතිවරන තරග කරනු පිනිස ටීඑම්වීපී සමග නිල සන්ධානයකට අවතීර්න විය. මීට පෙර පැවති ආන්ඩු ද එල්ටීටීඊයට ප්‍රතිවාදී පැරා-මිලිටරි කන්ඩායම් සමග සහයෝගීව ක්‍රියා කර ඇති බව ප්‍රකාශ කරමින් එජනිස නායකයෝ මෙම සන්ධානය යුක්තියුක්ත කලහ.

කරුනාට ගමන් බලපත්‍රයක් ලබා දීමෙහි ලා හා ඉන් අනතුරුව සිදු වූ ඔහු අත් අඩංගුවට ගැනීමෙහි ලා රාජපක්ෂ සහෝදරයන්ගේ නිශ්චිත ක්‍රියාකලාපය තවමත් එලිමහනට පැමිනීමට ඇති දෙයකි. ඔහු අධිකරනයේ දී කල ප්‍රකාශය ඔවුන් එක්තරා දුරකට අපහසුතාවකට පත් කලා වීමට ඉඩ ඇති නමුදු, කරුනා බ්‍රිතාන්‍ය බන්ධනාගාරයක හුදකලාව සිටින්නේ ය යන කරුන, ඔහුගේ ප්‍රචන්ඩ අපරාධයන්ට ඔවුන්ගේ ඇති සම්බන්ධය පිලිබඳ සමස්ත කතාව ම පැවසීමට ඔහුට ඉඩ ලැබුන හොත් එයින් ඊටත් වඩා භීතියට පත් විය හැකි ශ්‍රී ලංකා ආන්ඩුවට සහ මිලිටරියට වඩා පහසු තත්වයකි.

© www.wsws.org